# ඉඩම් අමාත්‍යාංශය
# காணி அமைச்சு
# Ministry of Lands

"මිහිකත මැදුර",
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමඟ,
බත්තරමුල්ල.

"மிஹிகத்த மெதுர",
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"Mihikatha Medura",
Land Secretariat,
1200/6, Rajamalwatte Avenue,
Battaramulla.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 4-3/1/2021 (පොදු) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.04.07 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

<u>රාජ්‍ය ආයතනවල සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම</u>

උක්ත කරුණට අදාලව ජනාධිපති කාර්යාලය මගින් නිකුත් කර ඇති අංක SP/RD/02/10 හා 2010.02.03 දිනැති චක්‍රලේඛය (පිටපතක් අමුණා ඇත) සහ මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් ලිපි කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. රජයේ සංවර්ධන කාර්යයන් සඳහා පෞද්ගලික ඉඩම් අත්කර ගැනීමේ කටයුතු 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු නොවීම නිසා එම කාර්යයන් බොහෝ සේ ප්‍රමාද වීම හා එමගින් අදාල ආයතන වලට දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවීම, ඉඩම්වල හිමිකරුවන්ට නියමිත ප්‍රතිලාභ ලබා ගැනීමට බොහෝ කාලයක් බලා සිටීමට සිදුවීම සහ එමගින් රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදුවීම මෙන්ම ඒ තත්ත්වය මත විගණන විමසුම්වලට ලක්වීමටද සිදුව ඇති බව මවිසින් හඳුනා ගෙන ඇත.

03. අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා ඉහත සඳහන් ගැටලුකාරී තත්ත්වයන් අවම කර ගනිමින් ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය බාධාවකින් තොරව නියමිත කාලවකවානු තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුව ඇත.

04. එබැවින්, ඔබ අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතන වල ඉදිරි ඉඩම් අත්කර ගැනීමේ අවශ්‍යතා සඳහා වන යෝජනා සෘජුව ඔබ අමාත්‍යාංශය මගින් ඉඩම් අමාත්‍යාංශයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි. එසේ අත්කර ගැනීමේ යෝජනා ඉදිරිපත් කිරීමේදී, වන්දි ගෙවීමේ අරමුදල් සපයා ගැනීම ඉඩම් අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදන වලින් දරන්නේ නම් මු.රෙ. 53 අනුමැතියද, වන්දි ගෙවීම සඳහා ඔබ අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන දරන්නේනම්, ඒ බවට තහවුරු කිරීමේ ලිපියක්ද ඉදිරිපත් කල යුතු වේ.

05. එසේම, අත්කර ගැනීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී අදාල පොදු කාර්යය නිශ්චිතව හඳුනා ගැනීමද, පූර්වයෙන් සංවර්ධන සැලසුම් සකස් කර ගැනීම වැදගත් වන බවද අවධාරනය කරමි.

05. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේනම්, ඉඩම් අත්පත් අංශයෙන් (දුරකතන අංක : 0112-797500) විමසන ලෙසත් දන්වා සිටිමි.

ආර්.ඒ.ඒ.කේ. රණවක
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය

පිටපත් :
1. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
2. සර්වේයර් ජනරාල්
3. ඉඩම් කොමසාරිස් ජනරාල්
4. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
5. පළාත් ඉඩම් කොමසාරිස්